පුදුකුඩිඉරුප්පු ප්‍රාදේශීය සභාව
මුලතිව් දිස්ත්‍රික්කය
--------------------------

1. මූල්‍ය ප්‍රකාශන
---------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

2016 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 12 දින ද, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 18 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි. 2016 වර්ෂය සඳහා වූ විගණකාධිපතිගේ වාර්තාව 2017 අගෝස්තු 31 දින සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කරන ලදී.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දැක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශවලින් 2016 දෙසැම්බර් 31 දිනට පුදුකුඩිඉරුප්පු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
------------------------

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කළ ගිණුම් ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදවු කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත සඳහන් නිරීක්ෂණ සිදු කෙරේ.

(අ) සභාවට අයත් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු. 4,989,659 ක්වූ දේපළ 25 ක වටිනාකම,හිමිකම් ඔප්පු හා තක්සේරු වාර්තා නොමැතිකම නිසා විගණනයේදී සතුටුදායක ලෙස නිශ්චය කළ නොහැකි විය.

(ආ) එකතුව රු. 28, 241,175 ක් වූ ප්‍රාග්ධන වැය වටිනාකම සමාලෝචිත වර්ෂතුළදී ප්‍රාග්ධනගත නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා වූ දේපළ වටිනාකම අඩුවෙන් දැක්විණි.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු මුදල්
----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ සිදු කෙරේ.

(අ) එකතුව රු.10,800,417 ක්වූ ආදායම් වාර්තා තුනක් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබූ අතර ඒවා වසරකට වඩා හිඟ හිටීමට ඉඩහැර තිබුණි.

(ආ) එකතු වටිනාකම රු. 120,414 ක්වූ ජාතිය ගොඩනැගීමේ බදු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය නොකර, තැන්පතු ගිණුමේ රඳවා තිබුණි.

(ඇ) එකතුව රු.138,228 ක්වූ හිඟහිටි ණය ශේෂ වසර 01 සිට 05 දක්වා වූ කාල පරාසයක් තුළ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) එකතුව රු. 925,128 ක්වූ ගෙවීම් හිඟහිටි විවිධ ණය හිමි ශේෂ වසර 01 සිට 03 දක්වා වූ කාල පරාසයක් තුළ පියවීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 නීති,රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අවස්ථා නිරීක්‍ෂණය විය.

| නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) පරිච්ඡේදය iii රීති - 24 | සභාවට අයත් වීථි සහ පටු මාර්ග විස්තර,සභාව ස්ථාපනය කර වසර තුනක් ඇතුලත ප්‍රසිද්ධ කළ යුතු වුවද,එම විස්තර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර නොතිබුණි. |
| (ii) පරිච්ඡේදය iii රීති - 32 | වරිපනම් හා බදු සඳහා ලේඛනය පවත්වා නොතිබුණි. |
| (iii) පරිච්ඡේදය iii රීති - 33 | සමාලෝචිත වර්ෂය තුළදී වරිපනම් තක්සේරු සිදු කර නොතිබුණි. |
| (iv) පරිච්ඡේදය V රීති - 140 | එකතුව රු. 2,323,888 ක්වූ වසර 01 සිට 06 දක්වා කාලපරාසයක් තුළ නිරවුල් නොකළ අත්තිකාරම් පිළිබඳ කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) අංක 571 | එකතුව රු. 4,474,687 ක් වූ විවිධ තැන්පතු වර්ග 03 කට අදාල කල් ඉකුත් කේවල තැන්පතු 49 ක් වසර 02 ක සිට 04 දක්වා කාල පරාසයක් තුළ නිෂ්කර්ෂණය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | |
| (i) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 | සභාවට අයත් වාහන 14 ක ඉන්ධන පරිභෝජනය පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. |

(ඇ)	2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ

-----------------------------------

(i) වගන්ති 5.4.12	එකතු කළ අගය මත වූ බදු ආවරණය සඳහා ගෙවීම් කිරීමෙන් පසුව, එම ගෙවීම් පිළිබඳ විස්තර පසුව එළඹෙන මාසයේ 15 දින හෝ ඊට පෙර විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත දන්වා නොතිබුණි.

2 මූල්‍ය සමාලෝචනය

---------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය

------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය වූ රු. 36,178,341 ක මුදල පෙර වර්ෂය සඳහා වූ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය වූ රු. 31,827,810 ක මුදල හා සැසඳූ විට සමාලෝචිත වර්ෂය සඳහා වූ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් අතිරික්තයේ රු. 4,350,531 ක වැඩිවීමක් පෙන්නුම් කෙරේ. පුනරාවර්තන ප්‍රදාන සහ පුනරාවර්තන ආදායම් වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු විය.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ සිදු කෙරේ

(අ) සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලයේ ශුද්ධ අතිරික්තය රු. 92,953 පෙර වර්ෂය සඳහා වූ අනුරූපි ශුද්ධ අතිරික්තය වූ රු.69,810 සමඟ සැසඳුවිට සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලයේ රු.23,143 ක වැඩිවීමක් පෙන්නුම් කෙරිණි.

(ආ) පුනරාවර්තන වියදම ආදායමින් සියයට 71.17 ක් සංවර්ධන අරමුදල් සංචිතයට මාරුකර තිබුණි. කෙසේවෙතත්, සංවර්ධන අරමුදල් සංචිතයෙන් සියයට 2.5 ක් පමණක් සමාලෝචිත වර්ෂය තුළදී උපයෝගී කරගෙන තිබුණි. එය 2016 ජනවාරි 01 දිනට වූ ශේෂයෙන් සියයට 2.3 කට සමාන විය.

2.3. කාරක ප්‍රාග්ධන කළමනාකරණය

------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ සභාවේ කාරක ප්‍රාග්ධනය වූ රු. 90,224,775 ක්වූ අතර එය පෙර වර්ෂය සඳහා වූ අනුරූපී කාරක ප්‍රාග්ධනය වූ රු. 59,007,055 ක මුදල හා සැසඳූ විට, සමාලෝචිත වර්ෂය සඳහා වූ කාරක ප්‍රාග්ධනයේ රු. 31,217,216 ක වැඩිවීමක් පෙන්නුම් කෙරේ.

2.4 ආදායම් කළමනාකරණය

----------------------------

2.4.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

--------------------------------------

ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම් සහ වර්ෂයේ හිඟ ආදායම පිළිබඳ තොරතුරු සභාව විසින් ඉදිරිපත් කළ පරිදි පහත දැක්වේ.

| ආදායම් විෂය | ඇස්තමේන්තුගත මුදල | තත්‍ය මුදල | 2016 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ මුදල |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2.5 | 2.05 | - |
| කුලි හා බදු කුලි | 13,816 | 16,305 | 360 |
| බලපත්‍ර ගාස්තු | 1,015 | 2,902 | - |
| අනෙකුත් ආදායම් | 9,598 | 25,133 | 15,168 |
| | 24,454 | 44,545 | 15,528 |

**2.4.2 විදුලි සංදේශ කුළුණු සඳහා ගාස්තු**

සභා බල ප්‍රදේශයේ ඉදිකර තිබූ විදුලි සංදේශ කුළුණු 03 ක් සම්බන්ධයෙන්, 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ නියමනයන් ප්‍රකාරව සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම, මූලික සැලසුම් අනුමත කිරීම, අනුකූලතා සහතික නිකුත් කිරීම සහ ආවරණ අනුමැතිය ලබාදීම යන සිව් ආකාරයේ ගාස්තු තක්සේරු කර ගිණුම්වලට ගතයුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

3.4.3 මුද්දර ගාස්තු

වර්ෂ 01 සිට 05 ක් දක්වා කාල පරාසයක් තුළ ඉඩම් රෙජිස්ට්‍රාර් වෙතින් ලැබිය යුතු සභාවට අයත් එකතුව රු. 938,090 ක්වූ මුද්දර ගාස්තු අයකර ගැනීම සඳහා ඵලදායී ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) වසර 01 සිට 05 දක්වා වූ කාල පරාසයක් තුළ සභාව විසින් භාවිතා කරන වාහන 20 ක අයිතිය පවරාගැනීමට ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) සභා සේවක සංඛ්‍යාවේ වූ පුරප්පාඩු 18 ක් පිරවීමට කටයුතු කර නොමැති බැවින්, එය සංවර්ධන කටයුතු සඳහා බලපා ඇති බැව් පෙනීයයි.

(ඇ) අපේක්ෂිත අරමුණු සඳහා යොදා ගැනීමෙන් සභාවේ රු.මිලියන 44.54 ක මුදලක් සංවර්ධන අරමුදල් සංචිතයේ රඳවා ගැනීමට ඉඩහැර තිබුණි.

3.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) පිළිවෙලින් මුදල් රෙගුලාසි 756 හා 757 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කළ යුතු වාර්ෂික ගබඩා සමීක්ෂණ වාර්තා සහ වාර්ෂික ගබඩා සමීක්ෂණ වාර්තා විගණනයට ලබා නොදුනි.

(ආ) රුපියල් මිලියන 59.09 ක මුදල සමාලෝචිත වර්ෂය තුළදී උපයෝගී කර ගැනීමකින් තොරව, රාජ්‍ය බැංකු දෙකක කෙටි කාලින ස්ථාවර තැන්පතු වශයෙන් වසර 01 සිට 10 දක්වා වූ කාල පරාසයක් තිස්සේ රඳවා තැබීමට ඉඩහැර තිබුණි. කෙසේවෙතත්, එම බැංකු දෙකෙහි කෙටි කාලීන ස්ථාවර තැන්පතු වශයෙන් තැබීම සඳහා වූ

අනුමැතිය විගණනයට ලබාගත නොහැකි විය. සමාලෝචිත වර්ෂය තුළදී එම තැන්පතු මත වූ පොළී ආදායමේ සියයට 1.68 ක පිරිහීමක් නිරීක්ෂණය විය.

3.3 අත්හැරදැමූ ව්‍යාපෘති

-----------------------

පිරිවැය එකතුව රු. 58,260,000 කට ඇස්තමේන්තු කරන ලද ප්‍රාග්ධන කර්මාන්ත 17 ක් සමාලෝචිත වර්ෂය තුළදී අත්හැර දමා තිබුණි. ඒවා අත්හැරීමට තුඩුදුන් හේතු විගණනයට ලබාගත නොහැකි විය.

3.4 ප්‍රමාද වූ ව්‍යාපෘති

--------------------

එකතුව වටිනාකම රු. 777,691 ක් වූ ප්‍රාග්ධන කර්මාන්ත 02 ක් සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රදානය කර වැඩ ආරම්භ කර තිබූ නමුත්, සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ඒවා නිමකර නොතිබුණි. ඒ නමුත් වටිනාකම රු.777,691 ක එම වැඩ ප්‍රාග්ධන වැඩ වශයෙන් පෙන්වමින් සමාලෝචිත වර්ෂයේ විවිධ ණය හිමි ගිණුමට බැර කර තිබුණි.

3.5 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

සභා බල ප්‍රදේශයේ ඉවත්කරන කැළි කසල පිලිස්සීම හා පස්වලින් යටකිරීම යන ක්‍රියාමාර්ග පමණක් සභාව විසින් සිදුකර තිබූ අතර, කොම්පෝස් හා ප්‍රතිචක්‍රීය වැඩසටහන ඵලදායී අන්දමින් ක්‍රියාත්මක කර නොතිබුණි.

4 ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

----------------------------------------

4.1 ඵලදායී යන්ත්‍රණයක් වශයෙන් යොදාගැනීම පිණිස අයවැය ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත වියදම් විෂයයන් 06 ක වියදම හා තත්‍ය වියදම අතර රු. 39,710 සිට රු. 1,543,682 පරාසයක විචලනයන් නිරීක්ෂණය විය.

4.2 ප්‍රසම්පාදන සැලැස්ම

-----------------------

2016 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය ප්‍රකාරව, සභාවේ සමාලෝචිත වර්ෂය සහ පෙර වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන සැලැස්ම සහ ප්‍රසම්පාදන කාල සටහන් පිළියෙල කර නොතිබුණි.

4.3 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්

------------------------------------------------

කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අංක ඩීඑම්ජී/2009(1) හා 2009 ජූනි 09 දිනැති චක්‍රලේඛයට අනුව අවම වශයෙන් විගණන කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවැත්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළ එක් රැස්වීමක් පමණක් පවත්වා තිබුණි.

5. පද්ධති හා පාලන

-----------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය අවශ්‍ය වේ.

(i) ආදායම් රැස්කිරීම.
(ii) ස්ථාවර වත්කම්
(iii) ගිණුම්කරණය
(iv) සේවක සංඛ්‍යාව
(v) වාහන උයෝජනය
(vi) මිශ්‍ර තැන්පතු
(vii) අයවැය පාලනය
(viii) ප්‍රසම්පාදන ක්‍රියාවලිය